## සංචාරක රියදුරන් වෙත දැනුම් දීමයි

සංචාරක රියදුරන් පුහුණු කිරීම ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ (හෝටල් පාසල) සහ වෘත්තීය පුහුණු ආයතනය (VTA) මඟින් පමණක් සිදුකරනු ලබන අතර, පුහුණු පාඨමාලාව සඳහා රියදුරු නාම ලේඛණයන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් ලබා දෙනු ලැබේ. පාඨමාලා ගාස්තු ඉහත ආයතන වෙත පාඨමාලාව ආරම්භක දිනයේ දී පුහුණු පාසලට පමණක් ගෙවිය යුතු වේ. දින 4ක පාඨමාලා ගාස්තුව රු 5000/- කි. පුහුණු පාඨමාලාව සම්පූර්ණ කරන සංචාරක රියදුරන් සඳහා සංචාරක රියදුරු හැඳුනුම්පත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් නොමිලේ නිකුත් කරනු ලබයි.

මෙම කාර්‍ය සඳහා කිසිදු පුද්ගලයෙකු, නියෝජිතයෙකු, ආයතනයක් හෝ සංගමයක් පත්කර නොමැති අතර විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍යය මඟින් ප්‍රසිද්ධ දැන්වීම් ද පලකර නොමැති බව සියලුම සංචාරක සේවා රියදුරන් සඳහා දැනුම් දෙමු.

එබැවින් කිසිදු පුද්ගලයෙකුට රියදුරු පුහුණු පාඨමාලාව සඳහා හෝ සංචාරක රියදුරු හැඳුනුම්පත් සඳහා මුදල් ගෙවීමෙන් වලකින ලෙස කාරුණිකව දන්වා සිටිමු. එසේ ගෙවනු ලබන මුදල් සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වග නොකියන බව ද දන්වා සිටිමු.